**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல
Fax } 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk

මගේ අංකය
எனது இலக்கம்
My NO } 601/2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 07/04/2024
පැය 1440

# මාධ්‍ය නිවේදනය

**වෙඩි තබා පුද්ගලයන් දෙදෙනෙකු ඝාතනය කිරීමක් - මොරගහහේන පොලිස් වසම.**

2024.04.07 වන අද දින දහවල් කාලයේදි මොරගහහේන පොලිස් වසමේ මාලොස්ඇල හන්දිය ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි පුද්ගලයන් දෙදෙනෙකුට වෙඩි තබා පලා ගොස් ඇති බවට මොරගහහේන පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. වෙඩි තැබීමෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයින් දෙදෙනා හොරණ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පුද්ගලයෙකු මිය ගොස් ඇති අතර ප්‍රථිකාර ලබමින් සිටියදී පසුව අනෙක් පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 50 සහ 52 ක යන වයස් වල පසු වූ පිළියන්දල හා පන්නිපිටිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කාර් රථයකින් පැමිණි නාදුනන පුද්ගලයින් පිරිසක් විසින් පිස්තෝල අවියක් උපයෝගී කර ගෙන මෙම වෙඩිතැබීම සිදු කර ඇති බවට පොලිසිය සැක කරන අතර වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. සිද්ධියට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මොරගහහේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**